# කොළඹ විශ්ව විද්‍යාලය
## ශාස්ත්‍ර පීඨය
## ශාස්ත්‍රවේදි දෙවන වසර පරීක්ෂණය (ආර්ථික විද්‍යාව) - 2018
## පළමු සෙමෙස්තර වාර අවසාන
## ECN 2120: මානව සම්පත් කළමනාකරණය පිලිබඳ ආර්ථික විද්‍යාව
## කාලය - පැය දෙකයි (02)

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

---

1).

I. මානව සම්පත් කළමනාකරණයේ (i) මූලික පරමාර්ථය සහ (ii) උපක්‍රමික පරමාර්ථ හා අරමුණු මොනවද? (ලකුණු 10)

II. "ශ්‍රී ලංකාව මානව සම්පත් කළමනාකරණය සංවර්ධනය කිරීමේ ඉහළ අවශ්‍යතාවයක් පවතින රටකි".ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? හේතු දක්වන්න. (ලකුණු 15)

2).

I. "මානව ප්‍රාග්ධන සම්පාදනය ආර්ථික සංවර්ධනයේ අත්‍යවශ්‍යම සාධකය වේ". මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 13)

II. සංවර්ධනය වෙමින් පවතින රටවල මානව ප්‍රාග්ධන සම්පාදනයේ ප්‍රධාන ගැටලු මොනවාද? (ලකුණු 12)

3).

I. මානව සම්පත් සැලසුම්කරණය යනු කුමක්ද? සංවිධානයකට මානව සම්පත් සැලසුම්කරණයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. ඔබ ABC සමාගමෙහි මානව සම්පත් කළමනාකරු බව උපකල්පනය කරන්න. ඔබ එම ව්‍යාපාර සමාගමේ "මානව සම්පත් සැපයුම" තක්සේරු කරන්නේ කෙසේද ? (ලකුණු 15)

4).

"රැකියා විශ්ලේෂණය මගින් සකස් කරනු ලබන ප්‍රධාන ලේඛන දෙක වන්නේ රැකියා විස්තරය හා රැකියා පිරිවිතරයයි".

I. රැකියා විස්තරය හා රැකියා පිරිවිතරය මගින් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 04)

II. රැකියා විස්තරය හා රැකියා පිරිවිතරයට ඇතුළත් අත්‍යවශ්‍ය මූලිකාංග විස්තර කරන්න. (ලකුණු 09)

III. කළමනාකරණ පුහුණු (Management Trainee) තනතුරක් පිළිබඳ රැකියා විස්තරය හා රැකියා පිරිවිතරය ලියා දක්වන්න. (ලකුණු 12)

5).

I. "ක්‍රමානුකූල බඳවාගැනීම යනු අනුක්‍රමිකව සිදු කළ යුතු පියවර කිහිපයක් ඇතුළත් ක්‍රියාවලියකි". පැහැදිලි කරන්න. (ලකුණු 17)

II. සේවක ආකර්ෂණය, තෝරාගැනීම හා බඳවා ගැනීම අතර වෙනස ඔබ විස්තර කරන්නේ කෙසේද? (ලකුණු 08)

6).

"අනුස්ථාපනය නව සේවකයෙකු සමාජගත නොකරයි. එසේම, කාලයත් සමඟ සේවකයා ආයතනයට හුරු පුරුදු වීම සාමාන්‍ය දෙයකි. එබැවින් අනුස්ථාපනය සඳහා සම්පත් වැයකිරීම නිෂ්ඵල බැව් පෙනේ". ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 25)

7). පහත මාතෘකා අතරින් ඕනෑම <u>**හතරක් (04)**</u> පිළිබඳව කෙටි සටහන් ලියන්න.

I. සේවකයෙකු තෝරාගැනීමේ ක්‍රම.

II. රැකියා නිර්මාණයේ වැදගත්කම.

III. මානව සම්පත් සැලසුම්කරණ මූලධර්ම.

IV. කළමනාකරණ ඉන්වෙන්ට්‍රි ( Management Inventory) සහ කුසලතා ඉන්වෙන්ට්‍රි (Skill Inventory).

V. සංවිධානයක අභ්‍යන්තරයෙන් සේවකයන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තියක වාසි හා අවාසි.

VI. ප්‍රතිස්ථාපන සටහන්.

(ලකුණු 6.25 බැගින්)